**මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය**

**පළමු වාර පරීක්ෂණය - 2018**

**චිත්‍ර කලාව - I** | **13 ශ්‍රේණිය** | **කාලය පැය තුනකි**

- **මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විතයි.**

  **<u>I කොටස</u>**
  - **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
  - **එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර තෝරා එයට අදාළ අංකය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියන්න.**

  **<u>II කොටස</u>**
  - **අනු කොටස් තුනකින් සමන්විතය.**
  - **එක් කොටසින් එක් ප්‍රශ්නය බැගින් තෝරා ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.**

- **I හා II කොටසට අයත් පිළිතුරු පත් එකට අමුණා භාර දෙන්න.**

---

**I කොටස**

- **අංක 1 සිට 5 තෙක් ප්‍රශ්නවලට වඩාත් යෝග්‍ය පිළිතුර පහත සඳහන් A, B, C, D, E යන රූප සටහන් ඇසුරෙන් තෝරන්න.**



A



B



C



D



E

1. A අක්ෂරයෙන් දැක්වෙන ඉන්දියාවේ බුද්ධ ප්‍රතිමා අතරින් විශිෂ්ඨ බුද්ධ ප්‍රතිමාවකි. එය අයත්වන්නේ,
   (1) මතුරා කලාවටය. (3) ගුප්ත කලාවටය. (5) ආන්ද්‍ර කලාවටය.
   (2) ගාන්ධාර කලාවටය. (4) සුංග කලාවටය. (..................)

2. B අක්ෂරයෙන් දැක්වෙන්නේ ශ්‍රී ලංකාවේ දුර්ලභ ගණයේ බුද්ධ ප්‍රතිමාවකි. එය දැනට දැකිය හැකි වන්නේ,
   (1) පන්කුලිය අශෝකාරාම පුදබිම ආශ්‍රිතවයි.
   (2) අනුරාධපුර මණිචෝරාරාමය ආශ්‍රිතවයි.
   (3) මහමෙව්නා උයන සහ අටමස්ථාන බුද්ධ ප්‍රතිමා අසල
   (4) ඉසුරුමුණි රන්මසු උයන ආශ්‍රිතවයි.
   (5) පොළොන්නරු වටදාගෙය ආශ්‍රිතවයි.

(.................)

3. C අක්ෂරයෙන් දැක්වෙන්නේ ගොලායත් නම් යෝධයෙකුගෙන් මිනිසුන් බේරාගත් යොවුන් වීරයෙකු ලෙස සැලකෙන, කිරිගරුඬින් නිමවූ මූර්තියකි. මෙහි නිර්මාණ ශිල්පියා වන්නේ,
   (1) රෆායල් සැන්සියෝ
   (2) ලියනාඩෝ ඩාවින්චි
   (3) මයිකල් ආංජලෝ
   (4) ඇලෙක්සැන්ඩ්‍රොස්
   (5) ප්‍රැක්සිටෙලස්

(.................)

4. D අක්ෂරයෙන් දැක්වෙන මූර්තිය හෙලනිස්ටික් යුගයේ ඉතා වැදගත් නිර්මාණයකි. මෙම මූර්තිය තුළින් නිරූපණය වන්නේ,
   (1) ට්‍රොජන් පූජකයෙක් සහ ඔහුගේ පුතුන් දෙදෙනාය.
   (2) හර්මිස් සහ ඩයෝනියස් යන පුතුන් දෙදෙනාය.
   (3) ප්‍රැක්සිටෙලස් හා ඔහුගේ පුතුන් දෙදෙනාය.
   (4) කුරොස් හා කෝරේ යන පුතුන් දෙදෙනාය.
   (5) මෙන්කුරේ රජු හා ඔහුගේ පුතුන් දෙදෙනාය.

(.................)

5. E අක්ෂරයෙන් නිරූපිත රෝම උඩුකය මූර්තිය පුද්ගලයෙකුගේ චරිතයේ ඇති තීක්ෂණ බැල්ම සහ කල්පනාකාරී බව පෙන්වන මූර්තියකි. එම මූර්තිය,
   (1) ජුලියස් සීසර්ය.
   (2) කැරකාලාය.
   (3) මාකස් ඔරුලීසස්ය.
   (4) ඩේවිඩ්ය.
   (5) ඔගස්ටස්ය.

(.................)

- **ප්‍රශ්න අංක 6 - 10 තෙක් ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.**

6. මූර්ති ශිල්පීන් බුද්ධ ප්‍රතිමාකරණයේ දී එහි පරිමාණයන් නිවැරදිව යොදා ගැනීම සඳහා උපයෝගී කරගන්නා උපකරණය,
   (1) සකපොරුව
   (2) ලඹ තට්ටුව
   (3) යටි පෝරුව
   (4) මට්ටම් ලෑල්ල
   (5) මුලු මට්ටම

(.................)

7. ''කියුරොස්කියුරෝ'' ක්‍රමය යනු,
   (1) වර්ණවල සනත්වය මතුවන පරිදි චිත්‍ර නිර්මාණය
   (2) ළඟට තද වර්ණ හා ඈතට ලා වර්ණ යෙදීම
   (3) විනිවිද පෙනෙන අයුරින් චිත්‍ර නිර්මාණය
   (4) ප්‍රස්තුතයට අදාළව එළිය අඳුර මැනවින් නිරූපණය
   (5) අඳුර තුළින් ආලෝකය පෙන්වීම.

(.................)

8. සන්නිදර්ශන චිත්‍රයක් යනු,
   (1) එක් සිතුවමකින් පිටපත් රාශියක් ලබා ගැනීමට හැකි චිත්‍ර වීම.
   (2) පාරිභාරික අවශ්‍යතාවයට ගැලපෙන චිත්‍ර නිර්මාණයකි.
   (3) ආදර්ශයක් ඉදිරියේ තබා ගනිමින් නිර්මාණය කරන චිත්‍රයකි.
   (4) කවියකට හෝ කතාවකට ගැලපෙන අයුරින් නිර්මාණය කරන චිත්‍රයකි.
   (5) පර්යාවලෝකනය අනුව අඳින ලද චිත්‍රයකි.

(.................)

9. දිය සායම් මාධ්‍යය චිත්‍රයක දැකිය හැකි සුවිශේෂී ලක්ෂණය වන්නේ,

(1) වර්ණ දීප්තිමත්ව යෙදීම
(2) සංගත හා විසංගතව වර්ණ යෙදීම.
(3) සුදු වර්ණය සම්මිශ්‍රව යෙදීම.
(4) වර්ණ පදාස ලෙස යෙදීම.
(5) විනිවිද පෙනෙන ලෙස වර්ණ භාවිතය.

(..................)

10. පොළොන්නරු නිශ්ශංක ලතා මණ්ඩපයේ කණුවල දක්නට ලැබෙන සුවිශේෂී කලා ලක්ෂණය වන්නේ,

(1) ප්‍රායෝගික අත්දැකීම් නිර්මාණ කාර්යයට යොදාගැනීමේ හැකියාව
(2) නව නිර්මාණ බිහි කිරීම හා බැඳුන ක්‍රියාකාරීත්වය
(3) නිරීක්ෂණ, අත්දැකීම් හා නිර්මාණශීලීත්වය තුළින් අපූර්ව වූ දෙයක් බිහි කිරීමේ හැකියාව
(4) දැකුම් කලු දෙයක් ලෙස සාර්ථකව නිර්මාණය කිරීම.
(5) අපේක්ෂිත කාර්යයට හානියක් නොවන අයුරින් අලංකරණ විලාස යොදා තිබීම.

(..................)

- **අංක 11 - 15 තෙක් දී ඇති එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුර F, G, H, I, J යන රූප සටහන් ඇසුරෙන් තෝරන්න.**



F



G



H



I



J

11. F අක්ෂරයෙන් දැක්වෙන සිතුවම නිර්මාණය කරන ලද්දේ,

(1) පුබුදු යුගයේ ශිල්පියෙකු වන රෆායෙල් සැන්සියෝය.
(2) උපස්ථිතිවාදී ශිල්පී එඩ්ගා ඩෙගාය.
(3) ඉන්දීය චිත්‍ර ශිල්පී අම්තා ශර්ගිල්ය.
(4) පුබුදු යුගයේ චිත්‍ර ශිල්පී ලියනාඩෝ ඩාවින්චිය.
(5) පශ්චාත් උපස්ථිතිවාදී චිත්‍ර ශිල්පී වින්සන්ට් වැන්ගෝය.

(..................)

12. G අක්ෂරයෙන් දැක්වෙන්නේ කාන්තා සුන්දරත්වය නිරූපණය කිරීමේදී අජන්තා ශිල්පියා සතු හැකියාවයි. මෙම අප්සරා රුව දැකගත හැකි ගුහාව වන්නේ,

(1) අජන්තාවේ අංක 10 ගුහාව
(2) අජන්තා අංක 17 ගුහාව
(3) තින්තාල් අංක 2 ගුහාව
(4) විශ්ව කර්ම ගුහාව
(5) දෝතාල් ගුහාව

(..................)

13. H අක්ෂරයෙන් දැක්වෙන සිතුවම තුළින් ස්වභාවික ලෝකය හැකිතාක් තථ්‍ය ස්වරූපයෙන් ගොඩනැගීමේ ප්‍රතිඵලයකි. මේ සිතුවම නිර්මාණය කරන ලද්දේ,
   (1) දෙවන ජූලියස් පාප් වහන්සේගේ සොහොන් කොතේය.
   (2) සිස්ටියන් දෙව් මැදුරේ සිවිලිමේය.
   (3) ශාන්ත මරියා දෙලා ග්‍රෙසි නම් තාපසාරාමයේ භෝජනාගාරයේය.
   (4) ශාන්ත පීතර දෙව්මැදුරේ බිත්තියකය.
   (5) ප්‍රංශයේ ලූවර් කෞතුකාගාරයේ බිත්තියේය.

(..................)

14. I අක්ෂරයෙන් දැක්වෙන්නේ පොළොන්නරු යුගයට අයත් සිතුවමකි. මෙය දක්නට ලැබෙන්නේ,
   (1) තිවංක පිළිමගෙයි ය.
   (2) ගල්විහාර විද්‍යාධර ගුහාවේ ය.
   (3) දිඹුලාගල මාරාවීදියේ ය.
   (4) ගොනාගොල්ලේ ය.
   (5) හිඳගල ය.

(..................)

15. J අක්ෂරයෙන් නිරූපණය වන්නේ කොළඹ යුගයේ විසූ විශිෂ්ඨ චිත්‍ර ශිල්පියෙකු වන සෝලියස් මැන්දිස් මහතාගේ සිතුවමකි. මෙම සිතුවම,
   (1) සුංග චිත්‍ර කලා සම්ප්‍රදායේ ඇතැම් කොටස් ගුරු කොටගෙන ඇත.
   (2) තමාට ආවේණික ශෛලියක් ගොඩනගාගෙන ඇත.
   (3) මානව රූපයේ ලාලිත්‍ය, වර්ණ සංයෝජනයේ සංගත බව, රේඛාවේ රිද්මය රකිමින් පෙරදිග අනන්‍යතාව සුරැකීම.
   (4) විහාර සිතුවම් කලාව නව මඟකට යොමු කර ඇත.
   (5) උපස්ථිතිවාදී කලාවේ ආභාෂය ලබා ඇත.

(..................)

- **ප්‍රශ්න අංක 16 - 20 තෙක් ප්‍රශ්නවලට වඩාත් යෝග්‍ය පිළිතුර කැටයම් ඇතුළත් පින්තූර ඇසුරින් සොයන්න.**



K



L



M



O



N

16. K අක්ෂරයෙන් නිරූපිත කැටයම හෙළ කලා නිමැවුම් අතර අගනා කලා කෘතියකි. ගුප්ත ආභාෂය ලබා ඇති මෙය,

(1) අනුරාධපුර රන්මසු උයනෙන් සොයාගත් අර්ධ උන්නත මූර්තියකි.
(2) ඉසුරුමුණි කැටයම් අතර නාරි දේහයේ සුන්දරත්වය පෙන්වන කැටයමකි.
(3) ආගමික මුහුණුවරකින් තොරව ලෞකික තේමාවක් නිරූපණය වෙයි.
(4) ප්‍රේමාන්විත තාරුණ්‍ය තුළ ඇති මනෝභාවයන් රළු මාධ්‍යකට මනරම්ව නිරූපණය කිරීමකි.
(5) මහාරාජ ලීලාසන ක්‍රමයෙන් නිරූපිත කැටයමකි.

(..................)

17. L අක්ෂරයෙන් නිරූපිත සඳකඩ පහණ දැකගත හැකි වන්නේ,

(1) පොළොන්නරු වටදාගෙය ඉදිරිපිට දී ය.
(2) අනුරාධපුර බිසෝ මාලිගාව ඉදිරිපිට දී ය.
(3) මිහින්තලේ ඛණ්ඨක චෛත්‍ය ඉදිරිපිට දී ය.
(4) රුවන්වැලි සෑ රජුන් ඉදිරියේ දී ය.
(5) පොළොන්නරු ගල් විහාරය ඉදිරිපිට දී ය.

(..................)

18. M අක්ෂරයෙන් නිරූපිත කැටයම,

(1) යාපහුව දළදා මැඳුරේ පාදමේ පනේල කැටයමකි.
(2) ගඩලාදෙණි විහාරයේ පාදමේ කැටයමකි.
(3) භාරුත් චෛත්‍ය ගල්වැටේ කැටයමකි.
(4) සාංචි තොරණ සශ්‍රීකත්වය හා සම්බන්ධ යක්ෂණී රුවක් දැක්වෙන කැටයමකි.
(5) අමරාවති චෛත්‍ය පුවරු කැටයමකි.

(..................)

19. N අක්ෂරයෙන් නිරූපිත කැටයම ඉන්දු නිම්න වැසියන් තුළ පැවති ඇදහිලි හා විශ්වාස පදනම් වූ ජන ජීවිතයේ අවස්ථාවක් සිහිපත් කරවයි. මෙම කැටයම හඳුන්වයි ලබන්නේ,

(1) ටෙරාකොටා මාධ්‍යයෙන් නිමවූ මව් දෙවඟන (ජගත් මාතා) නමිනි.
(2) රතුවැලි ගලින් නිමවූ ජගත් මාතා නමිනි.
(3) සුදු හුණුගලින් නිමවූ මව් දෙවඟන නමිනි.
(4) ලෝකඩ මාධ්‍යයෙන් නිමවූ නළඟන නමිනි.
(5) නර්තන විලාසයක් දක්වන කවන්ද රුවයි.


(..................)

20. O අක්ෂරයෙන් නිරූපිත කැටයම කණිෂ්ක රජු බුදු දහම වැළඳ ගැනීමෙන් පසු ''බොඩ්ඩෝ'' ලෙස නම් කළ ප්‍රථම බුද්ධ රූපයයි. මෙම රුව දැකගත හැකි වන්නේ,

(1) ටෙරාකොටා කැටයමක ය.
(2) රන් කාසියක ය.
(3) ගාන්ධාර කැටයම් පුවරුවල ය.
(4) අභිනිෂ්ක්‍රමණය කැටයමේ ය.
(5) නාලාගිරි දමනය කැටයමේ ය.

(..................)

- **අංක 21 - 25 තෙක් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී P, Q, R, S, T යන චිත්‍ර ඇසුරින් තෝරන්න.**



P



Q



R



S



T

21. මෙම සිතුවම් අතරින් ටැම්පිට විහාර සිතුවමක් වන්නේ කුමන අක්ෂරයද? (..................)
22. පහතරට චිත්‍ර සම්ප්‍රදායට අයත් කතළුව විහාර සිතුවම් කොටස වන්නේ මින් කුමන අක්ෂරයද? (..................)
23. දෙවරගම්පල සිල්වත්තැන, දේවේන්ද්‍රමූලාචාරි, හිරියල් නයිදේ, නිලගම පටබැඳි යන අය නිර්මාණකරණයේ යෙදුන විහාර චිත්‍රය ඇති අක්ෂරය කුමක්ද? (..................)
24. බුද්ධ චරිතය, ඓතිහාසික සිද්ධි පමණක් ඇති ලෙන් විහාරයේ අක්ෂරය කුමක්ද? (..................)
25. කොළඹ දිස්ත්‍රික්කයට අයත් පහතරට සිතුවම් ඇති කරගම්පිටිය සුබෝධාරාම විහාරයේ චිත්‍ර කොටස ඇති අක්ෂරය කුමක්ද? (..................)

- **අංක 26 - 30 තෙක් වඩාත් නිවැරදි පිළිතුර ඉදිරියේ ඇති රූප සටහන ඇසුරින් තෝරන්න.**

26. ඉදිරියේ දැක්වෙන චිත්‍රය තුළින්,
    (1) වළං කර්මාන්තයේ යෙදෙන කාන්තාවන්ගේ දුක්ඛිත බව කියාපායි.
    (2) ශ්‍රී ලාංකික චිත්‍ර ශිල්පී H.A. කරුණාරත්නගේ චිත්‍රයකි.
    (3) ජෝජ් කීට්ගේ සණික හැඩ භාවිතයෙන් ඇඳි චිත්‍රයකි.
    (4) ස්ටැන්ලි අබේසිංහයන්ගේ තෙලිතුඩේ හාස්කම් පෙන්වන කදිම නිදසුනකි.
    (5) ශාස්ත්‍රාලීය ශිල්ප ක්‍රම භාවිතයට ගෙන කරන ලද චිත්‍රයකි.





27. ඉදිරියේ ඇති නලගන සිතුවම,
    (1) ජේ.ඩී.ඒ. පෙරේරාගේ නිර්මාණයකි.
    (2) හැරී පීරිස්ගේ නිර්මාණයකි.
    (3) ජස්ටින් දැරණිගලගේ නිර්මාණයකි.
    (4) මුදලිඳු අමරසේකරගේ නිර්මාණයකි.
    (5) ඩේවිඩ් පේන්ටර්ගේ නිර්මාණයකි.

28. ඉදිරියේ දැක්වෙන චිත්‍රය නිර්මාණය තුළින් ක්ලෝඩ් මොනේගේ චිත්‍ර කලා ගමන් මග වෙනස් කළ චිත්‍රයක් විය. එය නම් කරන ලද්දේ,
    (1) හිරු උදාවක උපස්ථිතියක්
    (2) වෝටර් ලූ පාලම
    (3) රුවල් බෝට්ටු
    (4) ලිලී මල්
    (5) හාම්ලේජ් හි එළවලු වත්ත



29. ඉදිරියේ ඇති චිත්‍රය 1937 දී පිකාසෝ අතින් බිහිවූ ප්‍රබල ප්‍රකාශනාත්මක හා භාවාත්මක ප්‍රකාශනයකි. මෙය 'ගුවර්නිකා' නම් විය. මෙය,



(1) ඝනිකවාදී මූලාරම්භක චිත්‍රය වෙයි.
(2) සිවිල් යුද්ධයේදී මිනිසුන් අත්විඳි දුක්ගැහැට පිකාසෝගේ ආධ්‍යාත්මයේ සනිටුහන් වු ප්‍රවේශාත්මක සිතිවිලි චිත්‍රයට පාදක වී ඇත.
(3) පිකාසෝගේ රෝස යුගයේ නිර්මාණය වූවකි.
(4) පිකාසෝගේ විශ්ලේෂණාත්මක අවධියේ නිර්මාණය වූවකි.
(5) සරල හැඩ සහිතව ගැඹුරු අර්ථයක් පෙන්වන්නකි.

30. ඉදිරියේ ඇති චිත්‍රය,



(1) යුරෝපීය උපස්ථිතිවාදී චිත්‍රයකි.
(2) පශ්චාත් උපස්ථිතිවාදී චිත්‍රයකි.
(3) ඝණිකවාදී චිත්‍රයකි.
(4) පුනර්ජීවන සමයේ චිත්‍රයකි.
(5) අමූර්තවාදී සිතුවමකි.

- **ප්‍රශ්න අංක 30 - 35 දක්වා ඇති ප්‍රශ්නවලට U, V, W, X, Y යන අක්ෂර ඇසුරින් පිළිතුරු සපයන්න.**



U



V



W



X



Y

31. U අක්ෂරයෙන් නිරූපිත ග්‍රීක වාස්තු විද්‍යා නිර්මාණයක් වන මෙය පීඩියස්, කැලික්‍රෙටිස් සහ ඉක්තියස් යන ශිල්පීන් විසින් නිර්මාණය කරන ලද ගොඩනැගිල්ලකි. එහි නම කුමක්ද?

(1) අබුසිම්බල් දේවස්ථානය
(2) පාතිනොන් දේවස්ථානය
(3) ලැක්සෝර් දේවස්ථානය
(4) ශාන්ත පීතර දේවස්ථානය
(5) ලූවර් දේවස්ථානය

32. V අක්ෂරයෙන් නිරූපිත ගෘහ නිර්මාණය, නිර්මාණය කළ ශිල්පියා කවුද?

(1) දෙල්මඩ මුලාචාරි
(2) ගනේශ්වරාචාර්ය
(3) ස්තපතිරායර්
(4) සේනාධිලංකාර
(5) දේවේන්ද්‍ර මුලාචාරි

33. W අක්ෂරයෙන් නිරූපිත ගෘහයේ වියන් තලයේ ඇති ප්‍රසිද්ධ සිතුවම කුමක්ද?

(1) මාර පරාජය
(2) අලි ඇතුන් දන්දීම
(3) සංකස්ස හිණිමං දර්ශනය
(4) චුල්ලපදුම ජාතකය
(5) අනවතප්ත විල

34. X අක්ෂරයෙන් නිරූපිත ගොඩනැගිල්ල අංක 2 ශිව දේවාලයයි. එය ඉදිකරන ලද්දේ කවුරුන් සිහිවීම සඳහාද?

(1) පරාක්‍රමබාහු රජු
(2) නිශ්ශංකමල්ල රජු
(3) මා දේවී ඊශ්වරම්
(4) කෛකාරේ අම්මෙයාර්
(5) අගස්ති පුලතිසි

35. Y අක්ෂරයෙන් දැක්වෙන ගොඩනැගිල්ල කුමක්ද?

(1) මැදිරිගිරිය වටදාගෙය
(2) පොළොන්නරු වටදාගෙය
(3) ථූපාරාම වටදාගෙය
(4) මිරිසවැටිය වටදාගෙය
(5) ලංකාරාම වටදාගෙය

- **ප්‍රශ්න අංක 36 - 40 දක්වා දී ඇති එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුර පහත සඳහන් රූපය ඇසුරින් තෝරන්න.**



36. මෙම සිතුවම අඳින ලද්දේ,

(1) කමිලි පිසාරෝ
(2) ජෝර්ජ් බ්‍රාක්
(3) එඩ්ගා ඩෙගා
(4) එඩුවාඩ් මැනේ
(5) පෝල් ක්ලි

37. මෙම සිතුවම අයත්වන්නේ,
(1) සනිකවාදයට
(2) අධිතාත්වික වාදයට
(3) ආලෝකානු වාදයට
(4) රොමැන්ටික් වාදයට
(5) උපස්ථිති වාදයට

38. මෙම සිතුවම හඳුන්වා ඇත්තේ,
(1) නැටුම් පාඩම යනුවෙනි.
(2) මංගල උත්සවයක් යනුවෙනි.
(3) අවන්හලේ කාන්තාවෝ යනුවෙනි.
(4) වීදි නාට්‍යාංගනාවන් යනුවෙනි.
(5) නාට්‍යාගාරයක් ඇතුළත යනුවෙනි.

39. මෙම චිත්‍රය සුවිශේෂී චිත්‍රයක් වීමට හේතුව වන්නේ,
(1) තාරුණ්‍යයේ රසභාවයන් චිත්‍රය තුළින් නිරූපණය වීම.
(2) ආලෝකය හා චලනය වේගවත් පින්සල් පහරවලින් අවධාරණය වන ශෛලියක් නිරූපණය
(3) සංගත වර්ණ මාලාවක් යොදමින් පර්යාවලෝකනය පෙන්වීම.
(4) ග්‍රීක මිත්‍යා දේව කතාවල සුරංගනා රූප යෙදීම.
(5) පුනරුද සමයේ ශිල්පීන්ගේ නිර්මාණ ආභාෂය ලබා තිබීම.

40. මෙම චිත්‍ර ශිල්පියාගේ තවත් වැදගත් නිර්මාණයක් වන්නේ,
(1) ඇපල් වට්ටිය
(2) දෙවියන්ගේ දිනය
(3) තරු පිරි රෑ
(4) අර්තාපල් බුදින්නෝ
(5) හිස පීරන ස්ත්‍රිය

## II කොටස

### චිත්‍ර කලාව හා රසාස්වාදය

### අ කොටස

1. 20 වන සියවසේ ලංකාවේ විහාර සිතුවම් කලාවේ නව නිර්මාණ බිහිවූ වකවානුවකි. M. සාර්ලිස්, සෝලියස් මෙන්ඩිස්, සෝමබන්ධු විද්‍යාපති ප්‍රවීණයෝ විය.
   (i) M. සාර්ලිස් හා සෝලියස් මෙන්ඩිස් විසින් චිත්‍ර අඳින ලද විහාර 04ක් නම් කරන්න.
   (ii) සෝමබන්ධු විද්‍යාපති ශිල්පියා අඳින ලද බෙල්ලන්විල විහාරයේ චිත්‍රවල කලා ලක්ෂණ කෙටියෙන් විමසන්න.
   (iii) M. සාර්ලිස් හා සෝලියස් මෙන්ඩිස් යන ශිල්පීන් දෙදෙනාගේ සිතුවම් කලාවේ දක්නට ඇති සමාන අසමානතා පිළිබඳ උදාහරණ සහිතව විමසීමක් කරන්න.

2. 18 වන සියවසේ කන්ද උඩරටින් ඇරඹි බෞද්ධ චිත්‍ර කලාව තුළින් බොදුනුවන්ගේ පුහුදුන් සිත් බැතිබරින් පුබුදුවා ශ්‍රද්ධාවෙන් පෝෂණය කොට සුමගට යොමුකිරීමට හැකිවිය.
   (i) මහනුවර යුගයේ පහතරට චිත්‍ර දක්නට ඇති ස්ථාන 04ක් නම් කරන්න.
   (ii) කන්ද උඩරට චිත්‍ර කලාවේ විශිෂ්ටතම නිර්මාණ හමුවන්නේ දෙගල්දොරුවෙනි. වෙස්සන්තර ජාතකය පදනම් කර කෙටියෙන් විමසන්න.
   (iii) කන්ද උඩරට පැවති චිත්‍ර සම්ප්‍රදාය පහතරට සංක්‍රමණය වීමේදී සුලු වෙනස්කම් වලට භාජනය විය. උඩරට සහ පහතරට චිත්‍ර අතර ඇති වෙනස උදාහරණ සහිතව විමසන්න.

## ආ කොටස
## ඉන්දියාව

3. අජන්තා ගුහා චිත්‍ර ක්‍රි.පූ. 1 සිට 8 සියවස දක්වා වරින් වර නිර්මාණය වූ ගුහා 29 යුත් බෞද්ධ ලෙන් විහාරයකි.
   (i) ගෘහ නිර්මාණ සැලැස්ම අනුව ගුහා වර්ග 02කි. එම ගුහා වර්ග දෙක නම් කරන්න.
   (ii) අජන්තා චිත්‍ර අතරින් හමුවන පද්මපානි බෝසත් රූපය හා සම්බන්ධයෙන් කෙටි සටහනක් ලියන්න.
   (iii) අජන්තා චිත්‍ර අතර ජාතක කතා ඇසුරින් ශිල්පියාගේ ප්‍රකාශන හැකියාව විග්‍රහ කරන්න.

4. බුද්ධ පරිනිර්වාණයේ සිට ඉන්දියාවේ කිසිම කලා සම්ප්‍රදායක් තුළ බුදුරුවක් නිමවූ බව නොපෙනේ. බුදුරුව රූපකායෙන් සෑදීමට ශිල්පීන් මැලිවිය. කනිෂ්ක රජුගේ බුදුදහම ප්‍රචාරණය සඵල වූයේ බුදු පිළිමය නිර්මාණයත් සමගය.
   (i) ගාන්ධාර පුවරු කැටයම් දෙකක් නම් කරන්න.
   (ii) බ්‍රෙගම් පිළිමය තුළ දක්නට ඇති නිර්මාණශීලීත්වය ගැන කෙටියෙන් විමසන්න.
   (iii) ගාන්ධාර කලාව හා මථුරා කලාව සමකාලීන වුවද මථුරා කලා නිර්මාණ ඊට වඩා ආධ්‍යාත්මික ගුණයෙන් වැඩිය. අදාල බුදුපිළිම ඇසුරින් විමසන්න.

## ඉ කොටස
## යුරෝපය

5. මිසර කලාව ඔවුන්ගේ අබිරහස් ජීවන කලාව සහ අභිමානය, බලපරාක්‍රමය, ගොලුබසින් ලොවට කියාපායි.
   (i) මිසර වැසියන් ගොඩනගන ලද සුවිසල් දේවස්ථාන 2ක් නම් කරන්න.
   (ii) මුලින් ඉදිවූ සාමාන්‍ය සොහොන් පසුව මහා පිරමීඩ දක්වා විකාශනය වූ අයුරු කෙටියෙන් පහදන්න.
   (iii) සාම්ප්‍රදායික කලා නිර්මාණ කළ මිසර ශිල්පීන් ඉන් මිදී ස්වභාවික නිර්මාණවලට පෙලඹුනු බවක් දක්නට ඇත. මෙය සනාථ කිරීමට උදාහරණ දක්වන්න.

6. ඡායානුවාදය මෙන්ම ඝනිකවාදය ද ලොව බොහෝ කලා විචාරකයින්ගේ විමසුමට භාජනය වූ කලා සම්ප්‍රාදයන් දෙකකි.
   (i) ඡායානුවාදී ශිල්පියෙකු වූ පෝල් සෙසාන්ගේ නිර්මාණ 04ක් නම් කරන්න.
   (ii) වින්සන්ට් වැන්ගෝ තම කලා ජීවිතයේ දී කල වැදගත් සිතුවමක් අර්තාපල් බුදින්නෝ සිතුවම. ඒ පිළිබඳව විමසීමක් කරන්න.
   (iii) පැබ්ලෝ පිකාසෝගේ නිර්මාණ අනාගත කලා ලෝකය පැහැදිලි මාවතකට යොමුකිරීමට සමත්විය. ඔහුගේ නිල් යුගය, රෝස යුගය, ඝනික යුගය ඇසුරින් මෙම කියමන සනාථ කරන්න.